රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
பதிவாளர் நாயகம் திணைக்களம்
REGISTRAR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No: RG/MBD/1/චක්‍රලේඛ (V2)

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No.: 565

ඔබේ අංකය / உமது இல. / Your No:

234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
234/A3, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.
234/A3, Denzil Kobbakaduwa Mawatha, Battaramulla.

දිනය / திகதி / Date: 2022.09. 06


ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
..........................................

**<u>උපත්, විවාහ, මරණ ලේඛනයන්හි සහතික පිටපත්වල වලංගු කාලය තීරණය කිරීම.</u>**

රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරනු ලබන උපත්, විවාහ සහ මරණ ලේඛනයන්හි සහතික පිටපත්වල වලංගු කාලය පිළිබඳව ඇතැම් ආයතන විසින් කාල සීමාවන් දැක්වීම නිසා (උදා :- සහතිකය නිකුත් කළ දින සිට මාස 06ක කාලසීමාවක් සඳහා පමණක් වලංගු බව) සහතික පිටපත් ලබා ගැනීමට මහජනයා විශාල වශයෙන් පෙලඹවීමක් සිදුව ඇති බවට නිරීක්ෂණය විය.

02. ඒ අනුව රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ක්‍රියාත්මක කරනු ලබන සියලුම පනත්හි ප්‍රතිපාදන අනුව රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරනු සහතික පිටපතක වලංගු කාලය කිසිදු සීමාවකට ලක් නොකර පිළිගන්නා ලෙස අධ්‍යාපන අමාත්‍යාංශය, විදේශ කටයුතු අමාත්‍යාංශය, ආගමන විගමන දෙපාර්තමේන්තුව හා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව යන අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මේ වන විටත් දැනුවත් කර ඇත. එමනිසා මේ පිළිබඳව ඔබ කාර්යාලය වෙත පැමිණෙන සේවාලාභීන්ද දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු සැලස්විය යුතුය.

03. ඒ අනුව පසු පිටෙහි දැක්වෙන පරිදි සකස් කරන ලද නිවේදනය හෝ ඊට සුදුසු නිවේදනයක් මහජනතාවට හොඳින් දර්ශනය වන ආකාරයට ඔබ කාර්යාලයේ ප්‍රදර්ශනය කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

පී.එස්.පී.අබේවර්ධන
රෙජිස්ට්‍රාර් ජනරාල්

01. පිටපත :- ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස

# මහජනතාව වෙත කරනු ලබන විශේෂ නිවේදනයයි.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් සහතික කර ඔබ වෙත නිකුත් කර ඇති උප්පැන්න, විවාහ හා මරණ ලේඛනයක සහතික පිටපතක් මාස 06ක කාල සීමාවකින් පසුව අවලංගු නොවන අතර ඕනෑම කාල සීමාවක් සඳහා වලංගු වේ. මේ පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශය, විදේශ කටයුතු අමාත්‍යාංශය, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව හා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව යන ආයතන වෙත නිල වශයෙන් දැනුම් දී ඇති බැවින් ඔබ වෙත රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති පැහැදිලි සහතික පිටපතක් පවතී නම් නැවත නව පිටපතක් ලබා ගැනීමේ අවශ්‍යතාවක් නොවන බව මෙයින් දන්වා සිටිමි.

යම් අවස්ථාවක දී උප්පැන්න, විවාහ හා මරණ ලේඛනයක සංශෝධන සිදුකර ඇත්නම් පමණක් සංශෝධිත නව පිටපතක් ඉදිරිපත් කිරීම කළ යුතුය.

රෙජිස්ට්‍රාර් ජනරාල්
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව